# ආණ්ඩුව හමුවේ ඇති අභියෝගය

පසුගිය සති කිහිපයෙහි ම මේ තීරුවෙන් විදේශීය බලපෑම් ගැන සාකච්ඡා කෙළෙමු. මෙරට හා පිටරට ජීවත්වන ඇතැම් ජාතිකවාදී මතධාරීන්ට ද මේ පිළිබඳ පැහැදිලි අවබෝධයක් නොමැති බව පෙනී යයි. ඔවුන් බොහෝ විට බටහිර හා ඉන්දියානු බලපෑම් තේරුම් ගන්නේ දේශපාලන, ආර්ථික පදනමක සිට බව පැහැදිලි ය. ඉන්දීය බලපෑමට ප්‍රධාන හේතුව ලෙස ඔවුන් දකින්නේ තමිල්නාඩුවේ වෙසෙන අති මහත් දෙමළ ජනතාව ය. ඒ දෙමළ ජනතාව සතුටු කිරීමට හා පාර්ලිමේන්තු (ලෝක් සභා) හා ප්‍රාන්ත මැතිවරණවලදී ඔවුන්ගේ ඡන්දය දිනාගැනීමට ඉන්දීය පාලකයනට හා අනෙකුත් දේශපාලනඥයන්ට ලංකාණ්ඩුවට විරුද්ධව කටයුතුකිරීමට සිදු වී ඇතැයි ඉහත සඳහන් පිරිස සිතති.

බටහිරයන්ගේ මැදිහත්වීමට හේතු ලෙස ද මේ ජාතිකවාදීහු, විශේෂයෙන් ම බටහිර රටවල වෙසෙන්නෝ හා මෙරට ලැබෙන බටහිර අධ්‍යාපනයෙන් මුසපත්වූවෝ, ආර්ථික හා භූ දේශපාලන කරුණු දකිති. ඔවුන්ට අනුව නෝර්වේ මැදිහත්වීම වයඹ හා වෙනත් දිශාවල මුහුදු පත්ලෙහි ඇති තෙල් ආකර නිසා සිදුවෙයි. ඒ සමග නෝර්වේහි වෙසෙන දෙමළ ජනතාවගේ බලපෑම ගැන ද කියැවෙයි. මැතිවරණවලදී මේ දෙමළ ජනතාවගෙන් තීරණාත්මක බලපෑමක් සිදු වන්නේ යැයි පැවසෙයි.

බ්‍රිතානියේ ද මෙවැනි තත්වයක් පවතින්නේ යැයි ඔවුහු කියති. මැතිවරණවලදී තීරණාත්මක ව බලපෑ හැකි දෙමළ ජනතාවක් ලංඩන් නගරයේ උපනාගරික ප්‍රදේශවල ජීවත්වන බව පෙන්වාදෙන ඔවුහු විශේෂයෙන් ම බ්‍රිතානි කම්කරු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට හා අපේක්ෂකයන්ට ඒ දෙමළ ජනයාට සවන්දීමට සිදු වී ඇති බව පවසති. දෙමළ ජනයා බොරු ප්‍රචාර මගින් බ්‍රිතානි දේශපාලන පක්ෂ රවටා ඇතැයි එරට ජීවත්වන ඇතැම් සිංහලයන් හා මෙරට ජීවත්වන ඇතැම් අය ද සිතන බව ඔවුන්ගේ ලිපි ලේඛන මගින් පැහැදිලි වෙයි.

බ්‍රිතානි දේශපාලනඥයෝ එසේ රැවටීමට තරම් තොත්ත බබාලා නො වෙති. ඔවුහු ලංකාව ගැන දනිති. විශේෂයෙන් ම කම්කරු පාක්ෂිකයෝ අපේ රටවල් පිළිබඳ ඔවුන්ට පෙනෙන ආකාරයට කරුණු හදාරති. බ්‍රිතානි යටත්විජිතවාදය ඊනියා දෙවැනි ලෝක යුද්ධයෙන් පසු පවත්වාගෙන යෑමේ දී ප්‍රධාන කාර්යභාරය ඉටුකරන්නේ එරට කම්කරු පක්ෂය යැයි මම සිතමි. එයට ඊනියා යැයි කියන්නේ ඒ මූලික වශයෙන් ම බටහිර සිදු වූ යුද්ධයක් මිස අපේ ද යුද්ධයක් නොවූ බව කීමට ය. අප ඇතුළු සෙසු ලෝකයාට ඒ යුද්ධයට පැටලීමට සිදුවූයේ අප බටහිරයන්ගේ යටත්විජිත වූ බැවිනි. බටහිරයෝ සුපුරුදු ලෙස ඒ බව වසන්කර ඒ යුද්ධය ලෝක යුද්ධයක් ලෙස හඳුන්වති.

ඊනියා දෙවැනි ලෝක යුද්ධය ජයගත්තේ වින්ස්ටන් චර්චිල් මහතා ප්‍රමුඛ කොන්සර්වේටිව් පක්ෂයේ ආණ්ඩුවක් වුවත් යුද්ධයෙන් පසු ඒ පක්ෂය පරාජය වී ක්ලෙමන්ට් ඇට්ලි මහතාගේ ප්‍රධානත්වයෙන් කම්කරු පක්ෂය බලයට පත්විය. බ්‍රිතානි ඡන්දදායකයන් ඉවෙන් මෙන් දැනගත් කරුණ වූයේ බ්‍රිතානිය හා ලෝකය පාලනය කිරීමට එවකට සුදුසු ම පක්ෂය වූයේ කම්කරු පක්ෂය බව ය. ඇට්ලි මහතා (බ්‍රිතානීන් කියන ආකාරයට සාම්වරයා) ඉන්දියාව ඇතුළු ආසියාතික රටවල් කිහිපයකට යම් දේශපාලන නිදහසක් දීමට කටයුතු කෙළේ ය. ඒ ලෝක ආධිපත්‍යය බ්‍රිතානියේ ම (හා පසුව ඇමරිකාවේ) තබාගන්නා උපක්‍රමයක් විය.

ඊනියා දෙවැනි ලෝක යුද්ධයෙන් පසු වාමාංශික යැයි කියන අදහස් බටහිර යුරෝපයේ මෙන් ම නැගෙනහිර යුරෝපයේ ද ශක්තිමත් විය. නැගෙනහිර යුරෝපය කොමියුනිස්ට් වූ අතර බටහිර යුරෝපය සමාජ ප්‍රජාතන්ත්‍රවාදී විය. බටහිර ක්‍රිස්තියානි නූතනත්වය පවත්වාගෙන යෑමට ඊනියා වාමාංශික අදහස් ප්‍රයෝජනවත් විය. ඒ තත්වය බටහිර රටවල් සම්බන්ධයෙන් අද නැතිවුවත්, අනෙක් රටවල බටහිර ආධිපත්‍යය පවත්වාගෙන යෑමේ දී මේ වාමාංශික අදහස් තවමත් යම් මෙහෙයක් ඉටුකරන බව පෙනී යයි.

බ්‍රිතානි කම්කරු පක්ෂ මන්ත්‍රීවරුන් අතින් මෙන් ම මෙරට මාක්ස්වාදීන් අතින් ද අද ඉටුවන්නේ මේ මෙහෙය ය. මෙරට වඩාත්ම බටහිර ගැත්තෝ මාක්ස්වාදීහු වෙති. රනිල් වික්‍රමසිංහ මහතා ප්‍රමුඛ එ ජා ප බටහිරයන්ගේ සෘජු නියෝජිතයා වුව ද බටහිර යටත්විජිතවාදී අදහස් ප්‍රචලිතකිරීම මාක්ස්වාදීන්ට භාර වී ඇත. ඊනියා

© Prof. Nalin De Silva

පශ්චාත්නූතනවාදය හා මාක්ස්වාදය එකම වල්ලේ නොවුවත් එකම ගසේ පොල් වෙයි. මේ කරුණු සම්බන්ධයෙන් දීර්ඝ විස්තරයක් කිරීමට මේ අවස්ථාව නොවුවත් මෙරට ජාතිකත්වයක් නැති පිරිස් ඒ බටහිර ගසේ පොල් බව පැහැදිලි ය. (එංගලන්තයේ කිව් උද්‍යානයේ පොල් ගසක් කෘත්‍රිම පවත්වාගෙන යන බව මෙහි දී සිහියට නැගෙන්නේ බටහිර පොල් ගසකට ද සංකේතයක් ඇති බව පසක් කරමිනි).

බ්‍රිතානිය හා ඉන්දියාව ෆෙඩරල් විසඳුමක් බලහත්කාරයෙන් ඇතිකිරීමට කටයුතු කරන බව පැහැදිලි ය. පසුගියදා මෙරටට පැමිණි ඉන්දීය කෘෂිකර්ම ඇමතිවරයා පවසා ඇත්තේ මධ්‍යස්ථ මථධාරී තිස්ස විතාරණ හා ආනන්දසංගරී මහතුන්ගේ විසඳුම් ක්‍රියාත්මක කරන ලෙස ය. යමකු මධ්‍යස්ථ මතධාරියකු ලෙස හඳුන්වන්නේ බොහෝවිට තමන්ට සමාන අදහස් දරණ අයකු ය. අනෙක් වචන මෙන් ම මධ්‍යස්ථ මතධාරියා යන්න ද සාපේක්ෂ ය. ඉන්දියාවට අවශ්‍ය කරන්නේ කිනම් විසඳුමක් ද යන්න ඒ ප්‍රකාශයෙන් ද පැහැදිලි වෙයි. ඒ අතර බටහිර තානාපතිවරයකු පවසා ඇත්තේ තමන් මෙරට තවත් මියන්මාරයක් කරන බව ය. එයින් අදහස් කරන්නේ අප ඔවුන්ගේ විසඳුම ක්‍රියාත්මක නොකරන්නේ නම් ඊනියා මානව අයිතිවාසිකම් කඩකිරීම් හා වෙනත් එවැනි දෑට මුවා වී අපට ආර්ථික සම්බාධක පනවා අප තනිකර ඇතැම්විට එක්සත් ජාතීන්ගේ හමුදා එවා හෝ ඔවුන්ගේ විසඳුම ක්‍රියාත්මක කරන බව ය. ඒ විසඳුම ක්‍රියාත්මක කරන තෙක් අපට කොටි පැරදවීමට ඉඩක් නොදීමට ඔවුන් ක්‍රියා කරන බව ද පැහැදිලි ය. අවුරුදු විස්සකට පෙර ජ වි පෙ මර්දනය කිරීමේ දී මානව හිමිකම් කඩවීම් ගැන බ්‍රිතානි තානාපති කතා නො කෙළේ ය. මෙරට මාක්ස්වාදියෝ ද ජ වි පෙ මර්දනය කිරීමට ආයුධ සන්නද්ධ කල්ලි ඇතිකළා මිස මානව අයිතිවාසිකම් ගැන කතා නො කළහ. අද ඉරාකයේ මානව අයිතිවාසිකම් ගැන බටහිරයෝ කතා නො කරති. මානව අයිතිවාසිකම් ඇත්තේ අපේ එකාට මිස අපට විරුද්ධවාදියාට නොවේ යන්න බටහිර යටින් ක්‍රියාත්මක වෙයි. මානව අයිතිවාසිකම් අකුරට ම ආරක්ෂාකරමින් ලෝකයේ කෙරුණු යුද්ධයක් හෝ වෙනත් ආකාරයක කැරලි මර්දනයක් ගැන කිවහැකි අයෙක් වෙත් ද? එවැන්නන් ඇත්නම් කිශාගෝතමියට බුදුන් වහන්සේ කී අබ සොයාගැනීමට හැකිවිය යුතුව තිබුණි.

අද ආණ්ඩුව මුහුණ පා සිටින්නේ ඉතා අසීරු කටයුත්තකට ය. ආණ්ඩුවට අවංකව ම කොටි පැරදවීමට අවශ්‍ය නම් ඒ සඳහා පළමුව තම ජාත්‍යන්තර මිතුරන් හා සතුරන් පිළිබඳ මනා අවබෝධයක් තිබිය යුතු ය. ඊනියා සාම සාකච්ඡා කතාව, දේශපාලන විසඳුම ආදිය හොරගල් ඇහිලීමකට වඩා දෙයක් නොවිය යුතු ය. මෙරට බහුතරය මේ ආණ්ඩුව පත්කෙළේ ඒකීය රාජ්‍යය පවත්වගෙන යෑමට ය. එය බ්‍රිතානීන්ගෙන් ලැබුණේ යැටි පඩියන් කියන කතාව අවලාදයක් පමණකි. අපි ඒකීය නැත්නම් එක්සේසත් රාජ්‍යය පවත්වගෙන යමු. ආණ්ඩුව මේ ජනවරමට පිටින් යැවීමට බ්‍රිතානියට, ඉන්දියාවට හෝ මෙරට සිටින ඔවුන්ගේ නියෝජිතයන්ට හෝ ඉඩ නොදිය යුතු ය. ඒ ජනවරම වෙනස්කිරීමට අවශ්‍ය නම් එසේ කළ හැක්කේ ජනතාවට හා ජනතාවට ම පමණකි. ජනවරම වෙනස් නොවනතාක් ඒ රැකීමට ආණ්ඩුව බැඳී ඇත.

මේ අතර ජීවන වියදම ඉහළ යෑම ආදී ප්‍රශ්නවලට ද මුහුණ දීමට ආණ්ඩුවට සිදුවෙයි. ඒ ප්‍රශ්න ඔස්සේ බලයට පත්වී බටහිරයන්ගේ විසඳුම ක්‍රියාත්මක කිරීමට බලා සිටින එ ජා ප වෙයි. මේ සියල්ලට මුහුණ දෙමින් ආණ්ඩුවට ඉදිරියට යා හැක්කේ අවංකව කටයුතුකර ජනතාවගේ විශ්වාසය නැතිකර නොගැනීමෙනි. විදේශ බලපෑම් ගැන ප්‍රසිද්ධියේ කතාකිරීමට ආණ්ඩුවට කාලය පැමිණ ඇත. ආණ්ඩුවට ඇති එකම ආරක්ෂාව ජනතාවගේ විශ්වාසය පමණකි. ඒ නැතිවුවහොත් එහි වාසිය බ්‍රිතානියට, ඉන්දියාවට හා ඔවුන්ගේ ගැත්තන්ට ය. කොටි පැරදවීමට ඉඩ නොදෙන්නන් කවුදැයි නොවළහා ප්‍රකාශ කළ යුතු ය. මෙරටට සාමය උදාකළ හැක්කේ කොටි පැරදවීමෙන් පමණකි. කොටි පැරදවීමට ඉඩ නොදෙන්නෝ හා ෆෙඩරල් විසඳුම් ඇතිකිරීමට උත්සාහ කරන්නෝ සාම විරෝධීහු වෙති. ඒ සමග ප්‍රශ්නය නිවැරදිව හඳුනාගත යුතු ය. දෙමළ ජනයාට වී ඇති ඊනියා අසාධාරණය නම් අන් කිසිවක් නොව බ්‍රිතානීන්ගේ සමයෙහි දෙමළ ප්‍රභූන්ට දුන් ඇතැම් වරප්‍රසාද සර්වජන ඡන්දයත් සමග ක්‍රමයෙන් නැතිවීමට පටන්ගැනීම ය. එය අසාධාරණයක් විය හැක්කේ බ්‍රිතානීන්ට ඉන්දියාවට ඊනියා ලිබරල්වාදීන්ට හා කසිකබල් මාක්ස්වාදීන්ට ය. අවුරුදු දහස් ගණනක් මුළුල්ලේ මෙරට අනන්‍ය සංස්කෘතියක් ගොඩනැගූ සිංහල බහුතරයේ අයිතිවාසිකම් බ්‍රිතානියෝ උදුරාගත්හ. ඒ නැවත ස්ථාපිතකිරීම කාහටවත් කරන අසාධාරණයක් නො වේ.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva